# වැලිගම නගර සභාවේ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර අලුත් වැඩියා කිරීම.

සේවාදායකයා:

සභාපති,

වැලිගම නගර සභාව,

වැලිගම.

සැපයුම්කරු:

...............................

..............................

..............................

## පටුන

1. ලංසුකරුවන්ට උපදෙස්

2. දත්ත පත්‍රිකාව

3. පසු ගිය වසර 5 තුල ඉටු කරන ලද කාර්යයන්

4. මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය

5. අලුත්වැඩියාවන් සම්බන්ධ පිරිවිතර ලේඛනය

## 1 වන කොටස. ලංසුකරුවන්ට උපදෙස් (ITB)

| | |
|---|---|
| **A: සාමාන්‍ය** | |
| 1. ලංසු විෂය පථය | 1.1 දත්ත පත්‍රිකාවේ නම් කර ඇති ගැනුම්කරු, IV වන උපලේඛනයේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අදාල පරිදි කාර්ය සිදුකිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ඔබට ආරාධනා කරයි. මෙම ආරාධනය ලැබීමෙන් පසු, මෙම ආරාධනය ලැබීම සහ ලංසු ඉදිරිපත් කිරීමට ඔබ අදහස් කරන බව පිළිගැනීමට ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම ආරාධනය භාරගැනීමට අපොහොසත් වුවහොත් හෝ භාරගැනීමෙන් පසු මිල ගණන් ඉදිරිපත් නොකළේ නම්, අනාගතයේදී මිල කැඳවීමේදී ප්‍රසම්පාදන අස්ථිත්වය ඔබව නොසලකනු ලැබේ. |
| **B: ලේඛනවල අන්තර්ගතය** | |
| 2. ලේඛනවල අන්තර්ගතය | 2.1 පහත සඳහන් කොටස් වලින් ලේඛන සමන්විත වේ.<br>• I වන කොටස. ලංසුකරුවන්ට උපදෙස් (ITB)<br>• II කොටස. දත්ත පත්‍රිකාව<br>• III කොටස. පසු ගිය වසර 5 තුල ඉටු කරන ලද කාර්යයන්<br>• IV කොටස. මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය<br>• V කොටස. අලුත්වැඩියාවන් සම්බන්ධ පිරිවිතර ලේඛනය |
| **C: මිල කැඳවීම සකස් කිරීම** | |
| 3. ඔබේ මිල කැඳවීම ඇතුළත් විය යුතු ලේඛන | 3.1 මිල ගණන් පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:<br>(අ) මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය<br>(ආ) මිල උපලේඛනය (Bill of quantities) |
| 4. මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය සහ මිල උපලේඛණය | 4.1 ඔබ විසින් IV වන කොටසෙහි දක්වා ඇති ආකෘති පත්‍රය හා මිල උපලේඛනය, භාවිතා කර මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. මෙම ආකෘති පත්‍ර එහි ආකෘතියට කිසිදු වෙනස් කිරීමකින් තොරව සම්පූර්ණ කළ යුතු අතර ආදේශක භාර නොගනී. ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>4.2 විකල්ප ලංසු සලකා බලනු නොලැබේ. එකම අයිතමය සඳහා විවිධ විකල්පයන් ඉදිරිපත් නොකර, ලංසුකරුට ලබාදිය හැකි විකල්ප ලංසු අතරින් වඩාත්ම තරඟකාරී විකල්පය සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. |
| 5.ලංසු ලේඛන නිකුත් කිරීමේ ගාස්තුව සහ ලංසු සුරක්ෂණ මුදල | 5.1 වැලිගම නගර සභාවෙන් නිකුත් කරන ලංසු ලේඛන සඳහා පමණක් රු.1000.00 ක මුදලක් අය කරනු ලබයි. එම මුදල කිසිදු විටක ආපසු ගෙවනු නොලැබේ. අදාල ගාස්තු වැලිගම නගර සභාවේ සරප් වෙත ගෙවිය යුතුය.<br><br>5.2 මේ සඳහා ආපසු ගෙවන ලංසු සුරක්ෂණ මුදල රු.11,180.00 ක් වන අතර එම මුදල වැලිගම නගර සභාවේ සරප් වෙත ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවූ කුවිතාන්සියේ පිටපතක් ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය. ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ පසු අදාල මුදල් නිදහස් කරන අතර ඒ සඳහා තැන්පත්කරුගේ ඉල්ලීම සමඟ මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත් ලේකම්, වැලිගම නගර සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | |
|---|---|
| 6. මිල ගණන් සහ වට්ටම් | 6.1 දත්ත පත්‍රිකාවේ නිශ්චිතව දක්වා නොමැති නම්, සියලු අයිතම මිල ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.<br>6.2 මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු මිල, ඉදිරිපත් කරන ලද වට්ටම් ද ඇතුළුව මිල ගණන් වල මුළු මිල විය යුතුය.<br>6.3 වැට් බදු අදාල වේ නම් වෙන වෙනම දැක්විය යුතුය.<br>6.4 ලංසුකරු ඉදිරිපත් කරන මිල ගණන් කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අතරතුර කිසිදු විචල්‍යතාවයට යටත් නොවිය යුතුය. වෙනස් කළ හැකි මිලක් සමඟ ඉදිරිපත් කරන ලද මිල කැඳවීමක් ප්‍රතිචාර නොදක්වන ලංසුවක් ලෙස සලකනු ලබන අතර එය ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 7. මුදල් | 7.5 මිල ගණන් දැක්විය යුත්තේ ශ්‍රී ලංකාවේ රුපියල් වලින් පමණි. |
| 8. භාණ්ඩවල අනුකූලතාවයට අදාල ලියකියවිලි | 8.1 ඇමුණුම II සහ V හි දක්වා ඇති තාක්ෂණික පිරිවිතරයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව ඉදිරිපත් කළ යුතුය. |
| 9. ලංසු වල වලංගු කාලය | 9.1 මිල ගණන් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට පසු දින හතලිස් නවයක් (49) සඳහා මිල ගණන් වලංගු විය යුතුය |
| 10. ආකෘති හා මිල ගණන් අත්සන් කිරීම | 10.1 මිල ගණන් ටයිප් කර හෝ නොමැකෙන තීන්තයකින් විය යුතු අතර ලංසුකරු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි බලය ඇති පුද්ගලයෙකු විසින් අත්සන් කළ යුතුය. |
| **D: මිල ගණන් ඉදිරිපත් කිරීම සහ විවෘත කිරීම** | |
| 11. ලංසු ඉදිරිපත් කිරීම | 11.1 ලංසු ඉදිරිපත් කිරීමට පෙර ලංසුකරු විසින් සියලුම යන්ත්‍ර පරික්ෂා කල යුතුය<br>.11.2 සියලුම ලංසු පිටපත් දෙකකින් (2) යුතුව සම්පූර්ණ කොට "මුල් පිටපත" යනුවෙන් සඳහන් කවරයක මුල් පිටපතද , අනු පිටපත යනුවෙන් සඳහන් කවරයක අනු පිටපත බහාලීමෙන් අනතුරුව එම පිටපත් දෙකම තවත් කවරයක බහා වම්පස උඩ කෙළවරේ **"වැලිගම නගර සභාවේ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම"** ලෙස පැහැදිලිව ලියා මුද්‍රා තබා වැලිගම නගර සභාවේ සභාපති , වැලිගම නගර සභාව යන ලිපිනයට නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ වැලිගම නගර සභා කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.<br>11.3 ලංසු ලේඛණ මුද්‍රා තබා අවශ්‍ය පරිදි සලකුණු කර නොමැති නම්, අස්ථානගත වීම හෝ කලින් විවෘත කිරීම සම්බන්ධයෙන් ගැනුම්කරු කිසිදු වගකීමක් භාර නොගනී.<br>11.3 එක් ලංසුකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් ලංසුවක් පමණි.<br>11.4 ඉහත සඳහන් නියමිත ලංසු සුරක්ෂණ මුදල් සහ ආපසු නොගෙවන ඉල්ලුම්පත්‍ර ගාස්තු මුදලින් එකවර වැලිගම නගර සභාවේ සරප් වෙත ගෙවා ඇති ලංසු ඉල්ලුම් පත්‍ර මගින් පමණක් ලංසු මිල ගණන් ඉදිරිපත් කළ යුතුවේ. |
| 12. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය | 12.1 මිල ගණන් II වන කොටසේ "දත්ත පත්‍රිකාව" හි දක්වා ඇති ලිපිනයට ලැබිය යුතු අතර දත්ත පත්‍රිකාවේ දක්වා ඇති දිනය හා වේලාවට පෙර ඉදිරිපත් කල යුතුය. |

| | |
|---|---|
| 13. ප්‍රමාද වී ලැබෙන ලංසු | 13.1 II කොටස, ලංසු කරුවන්ට උපදෙස් හි 12.1 හි සඳහන් දිනට හා වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 14. ලංසු විවෘත කිරීම | 14.1 දත්ත පත්‍රිකාවේ දක්වා ඇති ලිපිනයේදී එහි සඳහන් දිනය සහ වේලාවට ප්‍රසිද්ධියේ මිල ගණන් විවෘත කරනු ලැබේ.<br><br>14.2 ලංසුකරුවන්ගේ නියෝජිතයෙකු පැමිණ එයට සහභාගි විය හැකිය. |
| **E: මිල ගණන් ඇගයීම හා සංසන්දනය කිරීම** | |
| 15. පැහැදිලි කිරීම් | 15.1 මිල ගණන් පරික්ෂා කිරීම, ඇගයීම සහ සංසන්දනය කිරීම සඳහා සහාය වීම සඳහා, ප්‍රසම්පාදන අස්ථිත්වය තම අභිමතය පරිදි ඕනෑම ලංසුකරුවකුගෙන් එහි මිල ගණන් පිලිබඳ පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිය හැකිය. ප්‍රසම්පාදන අස්ථිත්වයේ ඉල්ලීමක් නොමැතිව ලංසුකරුවන් විසින් එහි මිල ගණන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ඕනෑම පැහැදිලි කිරීමක් සලකා බලනු නොලැබේ.<br>15.2 පැහැදිලි කිරීම සඳහා වන ඉල්ලීම සහ ප්‍රතිචාරය ලිඛිතව විය යුතුය. |
| 16. ලංසු වල වගකීම | 16.1 ලැබුණු මිල ගණන් වල අන්තර්ගතය මත පදනම්ව ලංසුකරු විසින් මිල ගණන් වලට දක්වා ඇති ප්‍රතිචාරාත්මක භාවය පිලිබඳව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තීරණය කරනු ලැබේ.<br>16.2 නිකුත් කරන ලද ලියකියවිලි වලට සැලකිය යුතු ලෙස ප්‍රතිචාර නොදක්වන ලංසුවක් ලෙස තක්සේරු කරන්නේ නම්, එම ලංසුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 17. ලංසු ඇගයීම | 17.1 ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සෑම ලංසුවක්ම සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති බව පරික්ෂා කරනු ලැබේ.<br>17.2 ලංසු ඇගයීමේදී, පහත සඳහන් කරුණු සලකා බලනු ලැබේ:<br>(අ) ලංසුවේ මිල;<br>(ආ) අංක ගණිතමය දෝෂ නිවැරදි කිරීම සඳහා මිල ගැලපුම;<br>(ඇ) පිරිනමන වට්ටම් හේතුවෙන් මිල වෙනස් වීම.<br>17.3 මිල ගණන් ඇගයීමේදී මිල ගණන් වලට අමතරව දත්ත පත්‍රිකාවේ දක්වා ඇති වෙනත් සාධක සලකා බලනු ලැබේ. මෙම සාධක භාණ්ඩ මිලදී ගැනීමේ ලක්ෂණ, කාර්යසාධනය සහ නියමයන් හා කොන්දේසි හා සම්බන්ධ විය හැකිය. |
| 18. ඕනෑම මිල කැඳවීමක් පිළිගැනීමට සහ ඕනෑම මිල කැඳවීමක් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වයට ඇති අයිතිය | 18.1 ලංසු පිරිනැමීමට පෙර ඕනෑම මිල කැඳවීමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට, සහ ක්‍රියාවලිය අවලංගු කිරීමට සහ පිළිගැනීමට පෙර ඕනෑම වේලාවක සියලු මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය අයිතියක් ඇත. |
| **F: කොන්ත්‍රාත් ප්‍රදානය** | |
| 19. මිල ගණන් පිළිගැනීම | 19.1 අඩුම තක්සේරු කරන ලද ලංසුවක් ලෙස තීරණය කර ඇති සහ නිකුත් කරන ලද ලියකියවිලි වලට සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන ලංසුකරුගේ මිල ගණන් භාර ගනු ප්‍රසම්පාදන අස්ථිත්වය ඇත. |
| 20. පිළිගැනීමේ දැනුම්දීම | 20.1 ලංසුවේ වලංගු කාලය ඉකුත්වීමට පෙර, සාර්ථක ලංසුකරුට ලංසුව පිලිගත් බවට ලිඛිතව දැනුම් දෙනු ඇත. |
| **G: ගෙවීම්** | |
| 21.අත්තිකාරම් | ගෙවනු නොලැබේ. |
| 22. අන්තර් ගෙවීම් | කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසු කොන්ත්‍රාත් මුදලින් 90% ගෙවනු ඇත. |

| | |
|---|---|
| 23. රැඳවුම් මුදල් | 23.1 කොන්ත්‍රාත් මුදලින් 10% ප්‍රමාණයක් රඳවා ගන්නා අතර කාර්යය නිම කිරීමේ දින සිට දින 90කට පසු එම මුදල නැවත ගෙවනු ඇත. |
| 24.සේවා කොන්දේසි | 24.1.ලංසු පිරිනැමීමේදි සේවා ගිවිසුමකට එළඹීම අනිවාර්ය වේ. |
| 25. සේවා කොන්ත්‍රාත්තු සඳහා කාර්යසාධන සුරක්ෂණය | සේවා කෝන්ත්‍රාත්තු සඳහා කාර්යසාධන සුරක්ෂණ අවශ්‍යතාවය , මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට පහකට (5%) නොඅඩු විය යුතුයි. සේවා කොන්ත්‍රාත්තුවේ අපේක්ෂිත අවසන් දිනයෙන් ඔබ්බට දින විසි අටක් (28) ක් දක්වා සුරක්ෂණය වලංගු විය යුතුයි. |
| 26. ඇවර කරන ලද අලාභ | 26. වැඩ සම්බන්ධයෙන් , එය දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් 0.05 % ක උපරිමක් දක්වා අය කර ගත හැකිය. |
| 27. වැඩ නිම කිරීමේ කාලය | 27. සියලු අලුත්වැඩියා කටයුතු සති දෙකක් තුල නිම කිරීම අවශ්‍ය වේ. |

## II කොටස: දත්ත පත්‍රිකාව

| ලංසුකරුවන්ට උපදෙස් | |
|---|---|
| **1.1** | ප්‍රසම්පාදන අස්ථිත්වය :- වැලිගම නගර සභාව<br><br>ලිපිනය :- නගර සභාව, වැලිගම |
| **6.1** | මිල උපලේඛනයේ ඇති (Bill of Quantities) සියළුම අයිතමයන් සඳහා මිල ගණන් ඉදිරිපත් කල යුතුය. |
| **12.1** | මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා වන ලිපිනය - නගර සභාව, වැලිගම<br><br>මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය 2025.11.27 දින පෙ.ව.10.30 |
| **14** | මිල ගණන් විවෘත කරනු ලබන්නේ වැලිගම නගර සභා රැස්වීම් ශාලාවේදීය. 2025.11.27 දින<br>පෙ.ව.11.00 ට |
| **17.3** | ඇගයීම සඳහා සලකා බැලිය යුතු වෙනත් සාධක: -<br>1. ලංසු ලේඛන සමඟ ලංසුකරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතෙහි පිටපතක් සහ ලංසුව පිරිනමන ආයතනය, ව්‍යාපාර නාම ලියාපදිංචිය හෝ සමාගම් ලියාපදිංචිය සහිත ආයතනයක් බවට තහවුරු කෙරෙන ලේඛනවල සත්‍ය පිටපත් ඉදිරිපත් කල යුතුය.<br><br>2. මෙම කාර්ය ඉටුකිරීම සඳහා ලංසුකරුට අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබිය යුතුයි. ( සේවාලාභී ලැයිස්තුව අමුණා තිබිය යුතුයි.) |

## III කොටස

**පසු ගිය වසර 5 තුල ඉටු කරන ලද කාර්යයන්**

| වර්ෂය | ආයතනයේ නම/ලිපිනය | දුරකථන අංකය | ඉටු කරන ලද කාර්යය | මුදල |
|---|---|---|---|---|
| | | | | |

අත්සන : ………………………………………….

නම හා නිලමුද්‍රාව : ………………………………………….

දිනය : …………………………………………..

# IV වන කොටස

# මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය

දිනය: .......................

........................................................................................................................................ වෙත

පහත අත්සන් කල අපි මෙසේ ප්‍රකාශ කරමු.:

(a). අප විසින් පරීක්ෂා කර ඇති අතර නිකුත් කරන ලද ලේඛනයට කිසිදු වෙනස් කිරීමක් කර නොමැත;

(b). නිකුත් කරන ලද ලියකියවිලි වල සඳහන් කොන්දේසි වලට අනුකූලව කාර්යය ඉටු කිරිමට අපි ඉදිරිපත් වෙමු.

(C). පිරිනමන ඕනෑම වට්ටමක් ඇතුළුව අපගේ මිල ගණන් වල මුළු මිල: ...................................

..............................................................................................................................

(d). ITB උප වගන්තිය 12.1 ට අනුකූලව මිල ගණන් ඉදිරිපත් කිරීමේ කාලසීමාව නියම කර ඇති දින සිට ITB උප වගන්තිය 9.1 හි නිශ්චිතව දක්වා ඇති කාල සීමාව දක්වා අපගේ මිල ගණන් වලංගු වන අතර එම කාල පරිච්ඡේදය අවසන්වීමට පෙර ඕනෑම වේලාවක එය පිළිගැනීමට අප බැඳි සිටි.

(e). මෙම මිල කැඳවීම සහ ඔබ විසින් පිරිනමන ලද දැනුම් දීමේ ඇතුළත් ලිඛිත පිළිගැනීම සමඟ අප අතර බැඳීම් ගිවිසුමක් ඇති බව අපි තේරුම් ගනිමු.

(f). අවම වශයෙන් ඇගයීමට ලක් කළ මිල ගණන් හෝ ඔබට ලැබිය හැකි වෙනත් මිල ගණන් පිළිගැනීමට ඔබ බැඳී නොසිටින බව අපි තේරුම් ගනිමු.

අත්සන : ………………………………………………………………..........................................

මිල ගණන් ඉදිරිපත් කිරීමට බලයලත් තැනැත්තාගේ නම .....................................................

ජාතික හැදුනුම්පත් අංකය :……………………………………………………………………………

ආයතනයේ නිලමුද්‍රාව : ………………………………………………..............................................

දුරකථන අංකය : ………………………………………………………….........................................

විද්‍යුත් ලිපිනය :...................................................................................................................

දිනය:.......................................................................................................................................

V කොටස

අලුත්වැඩියාවන් සම්බන්ධ පිරිවිතර ලේඛනය

| No. | Description | Quantity | Rate | Amount |
|---|---|---|---|---|
| | Colour mixer machine | | | |
| 1. | 32A DOL contactor for motor | 1 | | |
| | Polythene compactor machine | | | |
| 2. | Star-Delta starter switch for 25hp 3ø motor (with AC-3 duty, 50 A rating, 0.5 – 10 seconds adjustable electronic timer or relay sequencer, and electrical interlock contactors) | 1 | | |
| | Pelletizer water bath | | | |
| 3. | Fabricate the bottom and sides with a 2.5 mm-thick mild steel sheet metal<br>Bottom and two long sides 10 ft x 3 ft<br>Two short sides 1 ft x 1 ft<br>Necessary welding material and sealant material | 1 | | |
| | Paint | | | |
| 4. | Corrosion removal with Wire Brush Wheels / Cups | As required | | |
| 5. | Zinc phosphate anti-rust primer | As required | | |
| 6. | Marine epoxy paint | As required | | |
| | Plastic melting machine | | | |
| 7. | Band heaters 30 cm X 21 cm (internal circumference) | 6 | | |
| 8. | Band heaters 10 cm x 42 cm | 3 | | |
| 9. | Band heater 6 cm X 83 cm | 1 | | |
| 10. | Temperature sensors | 4 | | |
| 11. | Control panel box (powder-coated sheet metal 1.2mm thick) | 1 | | |
| 12. | MCCB 100A 4 pole | 1 | | |
| 13. | 32A contactors | 4 | | |
| 14. | 42A MCB | 4 | | |
| 15. | 10A MCB | 1 | | |
| 16. | 62A 4-pole contactor | 1 | | |
| 17. | Temperature controllers (rotary) | 4 | | |
| 18. | Push button switch | 2 | | |
| 19. | Selector switch | 4 | | |
| 20. | Indicator lights | 2 | | |
| 21. | Voltage meter | 1 | | |
| 22. | Ampere meter | 1 | | |
| 23. | Current transformer (CT) | 1 | | |
| 24. | Electrical wiring materials (wires, lugs, terminal bars, cable ties, insulation sleeves, insulation tape, conduits, brackets, etc.) | As required | | |
| 25. | SAE90 gear oil | 5 Liters | | |
| 26. | Variable Frequency Drive for screw driving, 3-phase motor | 1 | | |
| | Pellet cutting machine | | | |
| 27. | Variable Frequency Drive with direction control and clutch control for a single-phase motor | 1 | | |
| 28. | Start/Run Capacitors for a single-phase motor | 2 | | |
| 29. | Dismantle and lubricate (grease) cutter wheel bearings. | | | |
| | | | | |
| 30. | Transportation charges | | | |
| 31. | Labour charges | | | |
| 32. | Total amount (without VAT) | | | |

33. Total without VAT (in words)……………………

34 .Bid validity………………………………………..

35. warranty…………………………………………..

36.**All repairs must be completed within two weeks.**

Time required for work completion and handing over………………. days

…………………………………  …………………………….

Signature  Date